# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1650 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
30 /10 /2024
පැය 0550

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - හිදෝගම පොලිස් වසම.**

2024.10.27 වන දින හිදෝගම පොලිස් වසමේ අතුරුවැල්ල ප්‍රදේශයේදී සැකසහිත ලෙස මියගිය පුද්ගලයෙක් සම්බන්ධයෙන් හිදෝගම පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර තිබුණි.

**මරණකරු වයස අවුරුදු 58 ක් වූ අතුරුවැල්ල, නාච්චාදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් නාච්චාදූව රෝහලේදී හදිසි මරණ පරීක්ෂණය පවත්වා පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකිරීම සඳහා 2024.10.28 වන දින අනුරාධපුර රෝහල වෙත යොමු කර ඇත. ඒ අනුව 2024.10.29 වන දින අධිකරණ වෛද්‍යවරයා විසින් මෘත ශරීරය සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණ සිදුකර මෙම මරණය **හිසට පහරදීම හේතුවෙන් ගෙළෙහි ඉහළ කොටසට හානි සිදුවීමෙන් වූ මරණයක්** බවට පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ලබා දී ඇත.

ඒ අනුව, 2024.10.27 වන දින මරණකරු ඔහුගේ මිතුරන් සිව්දෙනෙකු සමඟ මත්පැන් පානය කර ඇති බවත්, එහිදී මරණකරු බීමත්ව සිටි ඔහුගේ මිතුරෙකු සමඟ **බහින් බස්වීමක් දුර දිග යාම හේතුවෙන් මරණකරුගේ මුහුණට අතින් පයින් පහර දී ඇති** බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. ඒ අනුව පහරදී මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන නාච්චාදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඥාතීන්ට භාර දී ඇති අතර, හිදෝගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය ජයවර්ධනපුර කඳවුර.**

2024.10.29 වන දින උදෑසන කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 201 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන පෑලියගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 32 ක් වන කැළණිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පෑලියගොඩ පොලිස් ස්ථානය.**

2024.10.29 වන දින සවස් කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ 04 කණුව ප්‍රදේශයේදී පෑලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන කැළණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පෑලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.10.29 වන දින සවස් කාලයේ හා රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ දෙහිවල හා බඩෝවිට ප්‍රදේශවලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 02 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලි ග්‍රෑම් 300 ක් හා හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 300 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23 හා 29 වයස්වල පසුවන දෙහිවල හා පිළියන්දල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

2024.10.29 වන දින උදෑසන කාලයේ හා රාත්‍රී කාලයේ අතුරුගිරිය පොලිස් වසමේ හබරකඩ හා පනාගොඩ ප්‍රදේශවලදී අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදුකර **අයිස්**

**මත්ද්‍රව්‍ය ග්‍රෑම් 40 මිලි ග්‍රෑම් 10 ක් හා හෙරොයින් ග්‍රෑම් 06 මිලි ග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 22 හා 44 වයස්වල පසුවන රණාල හා පනාගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**06. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.10.29 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ වෙඩිකන්ද ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. කේරළ ගංජා සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පූනෑව පොලිස් ස්ථානය.**

2024.10.29 වන දින උදෑසන කාලයේ පූනෑව පොලිස් ස්ථානය ඉදිරිපිට විශේෂ රථවාහන සෝදිසි මෙහෙයුමකදී පූනෑව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් මඟී ප්‍රවාහන බස් රථයක තිබූ බෑගයක් පරීක්ෂා කිරීමේදී **කේරළ ගංජා කිලෝග්‍රෑම් 03 ග්‍රෑම් 600 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙක් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන වාද්දුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පූනෑව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව පොලිස් ස්ථානය.**

2024.10.29 වන දින රාත්‍රී කාලයේ මීගමුව පොලිස් වසමේ කාමච්චෝඩය ප්‍රදේශයේදී මීගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 56 (බෝතල් 75) ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන ආඬිඅම්බලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. හිංසාකාරි ලෙස මී ගවයින් ප්‍රවාහනය කළ ලොරි රථ තුනක් අත්අඩංගුවට - මඩාටුගම පොලිස් ස්ථානය.**

2024.10.29 වන දින දහවල් කාලයේ මඩාටුගම පොලිස් වසමේ හැවැන්තැන්නේගම ප්‍රදේශයේදී මඩාටුගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මී ගවයින් 49**

**දෙනෙකු හිංසනයට ලක්වන අයුරින් ප්‍රවාහනය කරමින් තිබූ ලොරි රථ තුනක්, රියදුරන් ද සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 41, 49 සහ 52 ක් වන ගනේවල්පොල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මඩාටුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අඹන්පොල පොලිස් ස්ථානය.

2024.10.29 වන දින සවස් කාලයේ අඹන්පොල පොලිස් වසමේ බැලුන්ගල ප්‍රදේශයේදී අඹන්පොල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන අඹන්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අඹන්පොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඉගිණියාගල පොලිස් ස්ථානය.

2024.10.29 වන දින සවස් කාලයේ ඉගිණියාගල පොලිස් වසමේ බකිණිඇත්තැව ප්‍රදේශයේදී ඉගිණියාගල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන පරගහකැලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඉගිණියාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 12. බලපත්‍ර නොමැතිව පුපුරණ ද්‍රව්‍ය සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - මකුළුගස්වැව පොලිස් ස්ථානය.

2024.10.29 වන දින දහවල් කාලයේ මකුළුගස්වැව පොලිස් වසමේ අලුත්වැව ප්‍රදේශයේදී මකුළුගස්වැව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව ඇමෝනියම් නයිට්‍රේට් ග්‍රෑම් 341 මිලිග්‍රෑම් 40 ක්, සේවා නූල් අඩි 6 ½ ක්, ජෙලටිනයිට් කූරු 04 ක් හා ඩෙටනේටර් 02 ක් සන්තකයේ තබා ගෙන යතුරුපැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු යතුරුපැදිය ද සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන මැල්සිරිපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මකුළුගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 13. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - මැදවච්චිය පොලිස් වසම.

2024.10.29 වන දින දහවල් කාලයේ මැදවච්චිය පොලිස් වසමේ ඒ 9 මාර්ගයේ මැදවච්චිය නගරයේදී නාඳුනන මෘත ශරීරයක් තිබෙන බවට ලද පණිවිඩයක් මත මැදවච්චිය පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මෘත ශරීරය පිරිමි පුද්ගලයෙකුගේ වන අතර අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත. වයස නිශ්චිතවම අනාවරණය කරගැනීමට නොහැකි බවත්, මෘත ශරීරයෙන් දැඩි දුර්ගන්ධයක් වහනය වන බවත්, කළු පැහැති කොට කලිසමක් හැඳ සිටින බවත් නිරීක්ෂණය වී ඇත.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 14. බඹර ප්‍රහාරයකින් පුද්ගලයෙකු මියයාම - කිරිඳිවැල පොලිස් වසම

2024.10.29 වන දින දහවල් කාලයේ කිරිඳිවැල පොලිස් වසමේ පරණ මීතිරිගල අමුණ ආසන්නයේදී බඹර ප්‍රහාරයකට ලක් වූ පුද්ගලයෙකු වතුපිටිවල රෝහලට ඇතුළත් කිරීමේදී මියගොස් ඇති බවට ලද තොරතුරක් මත කිරිඳිවැල පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 75 ක් වූ මීතිරිගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කිරිඳිවැල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 15. වන අලියෙකු පහරදීමකින් පුද්ගලයෙකු මියයාම - පරයනාලන්කුලම් පොලිස් වසම

2024.10.29 වන දින උදෑසන කාලයේ පරයනාලන්කුලම් පොලිස් වසමේ පරණ මැණික්ෆාම් ගම්මානයේ සිට සෙට්ටිකුලම පොලිස් වසමේ ක්‍රිස්තුවකුලම් ගම්මානයට ඇති කැලෑ සහිත අතුරු මාර්ගයේදී වන අලියෙකු පහරදීම හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට ලද තොරතුරක් මත පරයනාලන්කුලම් පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ සෙට්ටිකුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයෙකු සමඟ ඉහත කැලෑ සහිත මාර්ගය ඔස්සේ මැණික්ෆාම් ප්‍රදේශයට ගමන් කරමින් සිටියදී, මෙම වන අලි ප්‍රහාරයට ලක්ව ඇති බවට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. පරයනාලන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 16. වීසා නොමැතිව රැඳී සිටි විදේශීය ජාතිකයින් 06 දෙනෙකු අත්අඩංගුවට - සීදූව පොලිස් ස්ථානය.

2024.10.29 වන දින සවස් කාලයේදී සීදූව පොලිස් වසමේ අමන්දොළුව ප්‍රදේශයේ නිවසක රැඳී සිටියදී සීදූව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ආගමන විගමන නීති උල්ලංඝනය කරමින් වීසා නොමැතිව අනවසරයෙන් මෙරට රැඳී සිටි විදේශීය ජාතිකයින් 06 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 18, 23, 26, 39 හා 43 වයස්වල පසුවන බංගලිදේශ ජාතිකයන් වේ.**

සීදූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**17.** **මාරක රිය අනතුරක් - දෙහිවල පොලිස් වසම.**

2024.10.29 වන දින උදෑසන කාලයේ දෙහිවල පොලිස් වසමේ සුමුදු රාජපක්ෂ මාවතෙන් මහරගම දෙහිවල මාර්ගය දෙසට ධාවනය වූ යතුරුපැදියක් එම දිශාවටම ගමන් කරමින් සිටි පාපැදියකට ඉස්සර කිරීමට යාමේදී පාපැදියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පාපැදිකරු බරපතල තුවාල ලබා කළුබෝවිල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 62 ක් වූ අත්තිඩිය, දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. දෙහිවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**18.** **මාරක රිය අනතුරක් - ගොඩකවෙල පොලිස් වසම.**

2024.10.29 වන දින උදෑසන කාලයේ ගොඩකවෙල පොලිස් වසමේ පල්ලේබැද්ද ගල්පාය අතුරු මාර්ගයේ මුත්තෙට්ටුපොල ප්‍රදේශයේදී ගල්පාර දෙස සිට පල්ලේබැද්ද දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කළ පදිකයකුගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් පදිකයා බරපතල තුවාල ලබා පල්ලේබැද්ද රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා ඇඹිලිපිටිය රෝහලට මාරු කර යවා නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් වූ මුත්තෙට්ටුපොල, පල්ලේබැද්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගොඩකවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**19.** **මාරක රිය අනතුරක් - නාගොල්ලාගම පොලිස් වසම.**

2024.10.29 වන දින සවස් කාලයේ නාගොල්ලාගම පොලිස් වසමේ නාගොල්ලාගම වේරගල මාර්ගයේ තම්මිටගම ප්‍රදේශයේදී වේරගල දෙස සිට නාගොල්ලාගම දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය හරහා ගමන් කළ පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික කාන්තාව බරපතල තුවාල ලබා නාගොල්ලාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 75 ක් වූ තම්මිටගම, නාගොල්ලාගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය නාගොල්ලාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. නාගොල්ලාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**